## 2018 දෙසැම්බර් මස සාංඝික පවුල් දින සුපුවත
## "නත්තල යනු ප්‍රේමයේ මංගල්‍යයයි"

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 02 "නමෝ නමෝ ශුද්ධාත්මයාණෙනි...."

02. ප්‍රශංසාවට යොමුව : රෝම 8:28

**"තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබූවන්ට, එනම් ඔවුන් වහන්සේට ප්‍රේම කරන අයට, සියල්ලේදීම ඔවුන් වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු."**

2018 වසරේ අවසානයට පැමිණ සිටින අපි මුළු වසර පුරාම දෙවියන් වහන්සේ ඉමහත් ලෙස අපට ප්‍රේම කළ අත්දැකීම මුල් කරගෙන ඔවුන් වහන්සේට ප්‍රශංසා කරන්නට සූදානම් වෙමු. ශු.පාවුළු තුමා එදා රෝමවරුනට පැවසූ මෙවදන් වර්ථමානයේ ජීවත් වන ඔබ / මා වෙනුවෙන් ද පවසා ඇති බව අපගේ අත්දැකීම නොවේද? අප ජීවිත තුළ පසු කරන විවිධාකාර අසාර්ථකත්වයන්, අසීරු අවස්ථාවන්, අන්ධකාරයේ පැයවල් , මරණීය අත්දැකීම් තුළත් සැඟවී ඇති යහපත දකින්නට අප ලබා ඇති සුවිශේෂී වරප්‍රසාදයන් ගැන වැඩි වැඩියෙන් දෙවිඳුන් පසසමු. සියල්ල තුළ ඇති යහපත නොදැක, අසාර්ථකත්වය තුළම, අඳුරේම අතරමං වූ අවස්ථාවන් ගැන මනස්ථාපනය වෙමු. නව උපතක් බලාපොරොත්තුවෙන් නත්තල සමරන්නට සූදානම් වන මේ කාලය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීම සඳහාද සූදානමක් අප තුළ ඇති කරනු සඳහා දෙවිඳුන් යදිමින් ප්‍රශංසාවේ යෙදෙමු.

පුබුදු ගී අංක 178 "යුග ගණනක් පෙරුම් පුරා....."

03. ආපසු බැලීම :

* පුබුදු ජනතාව වචනය තුළ වචනය සොයන, ලැබෙන වචනය තුළ ජීවත් වෙමින් සාක්ෂි දරන්නට විශේෂ කැඳවීමක් ලත් ජනතාවකි. එම නිසා 2018 වසර තුළ ජීවත් වෙමින්, ජීවත් කරවන්නට අපට ලැබුනු වචනයට අවදිවීම, අත්දැකීම් බෙදා ගැනීම ඉතාම වැදගත්ය.
* හතර දෙනාගේ පුංචි සංඝයන් තුළ බෙදා ගන්න.

i 2018 වසර සඳහා අප ලද තේමාව "ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්තද ගින්නකි ; ආශිර්වාදයකි " මේ තුළ ජීවත් වෙමින් ඔබ ලද අත්දැකීම බෙදා ගන්න.

ii මේ වසර පුරාම ජීවත් වන්නට තවත් වචන 6ක් අපට ලැබිණි. ඊට ඔබේ ප්‍රතිචාරය කෙසේ වී දැයි බෙදා ගන්න.

i මනස්ථාපනය
ii ශු.ජුසේ වාස් මෙහෙයුම
iii 'වේ ප්‍රශංසා' විශ්ව ලේඛණය මුල් කරගෙන පරිසරයට ආදරය කිරීම.
iv සරල අල්පේච්ඡ ජීවිතයකින් සාංඝික වීම
v විරෝධයේ ලකුණක් වීම
vi පුබුදු ගමන ශු.සභාව සඳහාය

04. දවසේ සුපුවත : "නත්තල යනු ප්‍රේමයේ මංගල්‍යයයි"

i කොටස :

නත්තල 'නතාලේ ' යන ලතින් වචනයෙන් විකාශනය වී ඇති අතර එහි අරුත උපතයි. නත්තල ප්‍රධාන වශයෙන් උපන්දින මංගල්‍යයකි. මානව සංහතිය සම්බන්ධ ඉතිහාසයේ ගමන් මග වෙනස් කළ බිළිඳෙකුගේ ජන්මෝත්සවය සමරනු ලබන දිනය නත්තල් දිනයයි. නත්තල සුභාරංචියකි. ප්‍රීතියේ මංගල්‍යයකි. නත්තල අද ලොව පුරා සෑම කෙනෙක්ම බොහෝ විට ආගම් භේදයකින් තොරව හදපිරි සතුටින් සිහි කරන දිනයක් බවට පත්ව ඇත. නත්තල් දින, දෙවියන් වහන්සේ සිය ප්‍රේමය නිසාම ඒකජාතක පුතණුවන් සැබෑ මිනිසෙකු ලෙසින් මෙලොවට එවූ දිනයයි. එම නිසා එය සුභාරංචියකි. ප්‍රීතියකි. එලෙසම ප්‍රේමයේ මංගල්‍යය සමරණ දිනයකි.

- ශු.ලූක් 2:7 - **"ඈ කුළුඳුල් පුත්‍රයා බිහිකොට, රෙදිවලින් ඔතා තානායමෙහි ඉඩකඩ නොතිබුනු බැවින් ගව ඔරුවක බෑවූවාය."**
- ශු.ලූක් 1:32 - **"ඔවුන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක; පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක."**

* ඉහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨයන් මුල් කරගෙන නත්තල පිළිබඳව ඔබේ දැක්ම කුමක්දැයි හතර දෙනාගේ පුංචි සංඝයන් තුළ බෙදා ගන්න.

ii කොටස :

- නත්තලේ සැබෑ හිමිකරුවෝ කවුරුද? අද නත්තල කාගේ ද?
- හතර දෙනාගේ පුංචි සංඝයන් තුළ බෙදා ගන්න.

වචනයේ සේවකයා සඳහා :

* ආදි මව්පියන්ගේ අකීකරුකමේ පාපයෙන් වහල් භාවය උරුම කරගත් මිනිසාට නිදහස්, නිවහල් ජීවිතයක් උරුම කරදීමේ දේව පොරොන්දුව ඉටු වනු සඳහා අප සමිඳාණන් වහන්සේව දෙවියන් වහන්සේ මෙලොවට එවා වදාළ සේක.

* නත්තලේ පරම යථාර්ථය වන නව උපත, නැවුම් බව, ගැළවීම අත්කර දෙන්නට මෙලොවට පැමිණි සමිඳාණෝ ලෝකය තුළ තනි වූ, කොන් වූ, පීඩිත වූ අසරණයින් ඔසොවාලීමට වැඩිය සේක.

* කිතු උපත පළමුව අනාවරණය වූයේද එදා සමාජය තුළ පිළිගැනීමක් නොතිබුණු. දිළිඳු ජන කොට්ඨාශයක් වූ එඬේරුන්ට ය.

* එමනිසා නත්තලේ සැබෑ හිමිකරුවන් දුප්පත්කම, බේබදුකම, මත් ද්‍රව්‍ය ආදිය නිසා භේද වී විසිරී ගිය පවුල්, තනි වී, කොන් වී, අසරණ වී සිය පවුල් ජීවිත ගෙන යා නොහැකිව මිහිපිට අපා දුක් විඳින්නන්, රෝහල් තුළ විශේෂයෙන් පිලිකා රෝහල් තුළ, මහළු නිවාස තුළ, අනාථ කඳවුරු තුළ, සිරගෙවල්වල හා අනාථ නිවෙස් තුළ තනි වී අනේකාකාර දුක් විඳින්නන්ගේය. නත්තල අන්ධකාරයෙන් පිරි ඔවුන්ගේ ජීවිත තුළට ආලෝකයක් උදාකර දෙනු පිණිසය.

* අද නත්තල විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය තුළින් ජනතාව මුලා කරමින් සිය වෙළඳ ව්‍යාපාර සරුකර ගන්නට වෙරදරන්නන්ගේ ය, මත්පැන්සැල් හිමියන්ගේ ය. නොයෙක් විදියේ කෑම බීම, ඇඳුම් පැළඳුම් අලෙවි කරන්නන්ගේ ය. රූපලාවන්‍යාගාර හිමිකරුවන්ගේ ය.

* නත්තල් දා මැදියම් රැයේ උපත ලැබූ සමිඳුන් සමරණ එදින දෙව් මැඳුරේ දිව්‍ය යාගයට සහභාගි වනවා වෙනුවට තරුපහේ හෝටල්වල, සමාජ ශාලා තුළ මහා පරිමාණයේ සූදු පොලවල් තුළ නත්තල සමරන්නන් බොහෝය.

05. අප දෙසට :

- පිබිදුනු කිතුනුවන් ලෙස අප කොහේද? සිතා බලමු.
- අප සිටින තැන හඳුනා ගෙන අර්ථවත් ලෙස නත්තල ගත කිරීමට පියවර ගනිමු.
- අපත් ලෝකයේ සිටින්නන් මෙන් බොරු ආටෝපයට තැන දෙන, වෙළඳ ව්‍යාපාරිකයින් පොහොසත් කරන නත්තලක් සැමරීමට සූදානම් වන්නන් ද?
- අද අපි රටක් ලෙස මුහුණ පා සිටින දේශපාලනික අර්බුදය හමුවේ රටට නව උපතක් ලැබීමට "පක්ෂ දේශපාලනයෙන්" නිදහස් වීමට අපි සූදානම්ද? රට ගැන සිතා ශුද්ධාත්මයාණන් වහන්සේ මඟපෙන්වන අන්දමට පක්ෂ දේශපාලනයට ගැතිකම අපි දැන් අත්හැර තිබේද?
- නව උපතක් අත්දකින්නට සූදානම් වෙමින් පාපයට මනස්ථාපනය වෙමින් සිත් හැරීමක් පතා යාච්ඤා කරමු.
- යහපත් පාපොච්ඡාරණයක් කර ගනිමු.

06. ප්‍රායෝගිකව :

- සමාජයෙන් කොන් වූ, අසරණ වූ, දුගී, පීඩිත ජනතාව සොයා යමින් නත්තලේ ප්‍රීතිය බෙදා ගනිමු.
- මත් ද්‍රව්‍ය, මත්කුඩු වලට ඇබ්බැහි වී ජීවිතය විනාශ කරගන්න අය, ප්‍රේමයෙන් තොරව, එකමුතුකමින් තොරව, මානසික පීඩාවන්ගෙන් දුක්විඳින අය, දිළිඳු වූවන් උදෙසා යාච්ඤා කරමු.

07. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 175 "ඉසිකෝ මානෙන්...."

*************************